# හින්දු ආගමික උරුමස්ථානයක පැවැත්මට බලපාන පූජනීයත්ව සංකල්පය

කේ.එම්.ජී.ඒ. මානගේ[1]

අතීත උරුමයන් තුළ ගැබ්ව පවතින සංස්කෘතිකමය අගයන්ට ගරු කිරීම හා රැකගැනීම සෑම පුරවැසියෙකුගේම වගකීමකි. හින්දු ආගමික උරුම සංරක්ෂණ ක්‍රියාවලියේ ඓතිහාසික වර්ධනය දෙස බැලීමේදී එය අගය මූල සංරක්ෂණ (Value-based conservation) ප්‍රවේශය ඔස්සේ මනාව අධ්‍යයනය කළ හැකිය. එහිදී උරුමස්ථාන හා බැඳී පවතින පූජනීයත්වය යන අගය ඉතා වැදගත් වේ. හින්දු වාස්තු ශාස්ත්‍ර න්‍යායන්ට හා විශ්වාසයන්ට අනුව අදාළ උරුමස්ථානය තුළට පූජනීයත්වය ආරෝපණය වීමේ සංකල්පමය ක්‍රියාවලිය හා මේ තුළ ගැබ්ව ඇති සමාජීය වටිනාකම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ විය. හින්දු ආගමික උරුම ක්ෂේත්‍රයක පැවැත්ම සඳහා පූජනීයත්ව සංකල්පය දායක වන්නේ කෙසේද? යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වේ. මෙහිදී පුස්තකාල පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, අන්තර්ජාල පරිහරණය, හා විෂය ප්‍රාමාණිකයින් ඇසුරෙන් ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ දත්ත රැස්කිරීම තුළින් දකුණු ඉන්දීය හින්දු උරුමස්ථානයක පූජනීයත්වය කෙරෙහි බලපාන ආධ්‍යාත්මික සංකල්ප පිළිබඳ අධ්‍යයනය කිරීමත් "පූජනීයත්වය" යන්න සමාජීය වශයෙන් කෙතරම් ප්‍රබල සංකල්පයක් වේද යන්න විමසීමත්, අගය මූල සංරක්ෂණ ප්‍රවේශය යටතේ මෙම සංකල්පය විග්‍රහ කර බැලූ විට එය හින්දු ආගමික උරුම ක්ෂේත්‍රයක පැවැත්මට කෙතරම් වැදගත් වේද යන්න විමසීමත්, පර්යේෂණ ක්‍රමවේදය ලෙස පෙන්වාදිය හැකිය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව තුළ පවතින හින්දු ආගමික උරුම ක්ෂේත්‍රයන්හී පැවැත්ම කෙරෙහි පූජනීයත්ව සංකල්පය බලපා ඇති බව හඳුනාගත හැකිය. ඒ සඳහා මහනුවර " සෙල්ව විනායගර් කෝවිල" ක්ෂේත්‍ර අධ්‍යයනයක් ලෙස යොදා ගන්නා ලදී. එහිදී වාස්තුවිද්‍යාත්මක අංගයන්ගේ සහ සංස්කෘතිකමය ක්‍රියාවලිය කෙරෙහි පූජනීයත්ව සංකල්පය බලපා ඇති ආකාරය මෙම පර්යේෂණයේදී විමසුමට බඳුන් විය. මෙම සංකල්පය තුළ හින්දු දේව වන්දනය, දිව්‍ය ශක්තිය, ආශිර්වාදය හා භක්තිය යන ආධ්‍යාත්මික කරුණු අන්තර්ගතව ගොඩනැගුණු සමාජ සම්මතයන් හා විශ්වාසයන් ඇතුළත් වූ බව මූලික වශයෙන් පෙනීයයි. එසේම බටහිර අධිපතිවාදී උරුම සංරක්ෂණ ක්‍රියාවලිය තුළ දක්නට නොලැබෙන සුවිශේෂීතා හින්දු ආගමික පූජනීයත්ව සංකල්පය තුළින් හඳුනාගත හැකිය. එහිදී හින්දු විශ්වාසයන්ට අනුව උරුම ක්ෂේත්‍රයේ පූජනීයත්වය හා සම්බන්ධව පාරභෞතික සංකල්පයන්ගේ ප්‍රබලත්වය සුවිශේෂ වේ. විශේෂයෙන්ම හින්දු ආගමික උරුම ක්ෂේත්‍රයන්හී ආරක්ෂාව හා පැවැත්ම තහවුරු කිරීමේදී අනුගමනය කරන සාම්ප්‍රදායික යාන්ත්‍රණය, චක්‍රීය අලුත්වැඩියාව හා ප්‍රතිනිර්මාණය ඔස්සේ දියත්වීමට ද පූජනීයත්වය යන සංකල්පය ප්‍රබල ලෙස බලපා ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : අගය මූල සංරක්ෂණය, උරුම ක්ෂේත්‍රය, පූජනීයත්වය, හින්දු ආගම

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.geeth.a.manage@gmail.com